**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ මුද්දර ගාස්තු රු. 12,424,970 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉකුත් වර්ෂ වලට අදාල ආදායම් සමුච්චිත අරමුදල මඟින් ගැලපීම් කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ සිට මෙම කරුණු පිළිබඳ විශේෂ අවධානයකින් කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත මෝටර් රථ අළුත්වැඩියා වියදම් රු. 72,150 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී මෙම දූර්වලතා මඟහරවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | ගිණුම් විෂයයන් 02 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 2,040,512 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී මෙම වෙනස නිවැරදි කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**-----------------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ------------------------- | ------------------ | ------------ | ------------------------ |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 (2)(ඇ) | 1988 වර්ෂයේ සිට 2018 නොවැම්බර් දක්වා අවස්ථා 176 කදී ලබාදී තිබුණු රු. 2,802,620 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දීර්ඝ කාලයක සිට පැවතඑන මෙම අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී ඇති බවත්, තවදුරටත් සොයා බලන බවත් දන්වමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 1996 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු. 106,721 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා මිශ්‍ර තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවස්ථානුකූලව මෙම මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 03 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉන්ධන පරීක්ෂාව කඩිනමින් සිදු කරන බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | සිදුව ඇති දුර්වලතා ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් අදාල පහසුකම් සලසාදීමට කටයුතු කළ යුතුවේ. | කාර්යාල වෙබ් පිටුව විවෘත කර ඇති බවත් විද්‍යුත් පහසුකම් සහිත මහජන පුස්තකාලය නොබෝ දිනකින් ජනතාව අතරට පත් කිරීමට නියමිත බවත් සේවා සැපයීමේ අනෙකුත් පහසුකම් ද ඉදිරියේදී ලබා දිය හැකි බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,698,546 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,922,465 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,064,500 | 8,475,917 | 10,418,688 | 3,742,527 | 8,398,900 | 8,849,065 | 7,735,275 | 5,946,338 |
| කුලී | 2,531,575 | 1,250,905 | 1,285,740 | 178,408 | 2,591,990 | 1,891,521 | 1,472,020 | 183,158 |
| බලපත්‍ර ගාස්තු | 1,838,200 | 1,434,054 | 1,434,054 | - | 1,160,250 | 1,469,208 | 1,454,908 | - |
| වෙනත් ආදායම් | 13,235,800 | 24,237,759 | 20,966,583 | 11,884,326 | 9,536,000 | 8,275,405 | 11,880,508 | 8,043,012 |
| | 26,670,075 | 35,398,635 | 34,105,065 | 15,805,261 | 21,687,140 | 20,485,199 | 22,542,711 | 14,172,508 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

(අ) වරිපනම්

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 3,652,850 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට | වරිපනම් පැනවීමේදී සිදුව ඇති ව්‍යාකූල තත්ත්වය මත කොටසක් කපා හැරීමට |

| | | |
|---|---|---|
| කාලයක සිට පැවති රු. 2,673,569 ක් ඇතුලත් වී තිබුණි. | කටයුතු කළ යුතුවේ. | ඉල්ලීම් කර ඇති බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**(ආ) අක්කර බදු**

------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 81,677 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවති රු. 67,870 ක් ඇතුලත් වී තිබුණි. | අක්කර බදු සත්‍යාක්ෂණයක් සිදුකර හිඟ ආදායම නිරවුල් කරගත යුතුවේ. | සත්‍යාක්ෂණයක් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 1,242,833 ක් හා මුද්දර ගාස්තු රු. 2,578,815 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකරගත යුතුවේ. | මුද්දර ගාස්තු උපලේඛන සකස් කර ඉදිරිපත් කර ඇති බවත් උසාවි දඩ ආදායම් මේ වනවිට හඳුනාගෙන ඇති බවත් දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, බල ප්‍රදේශයේ සංවර්ධනය හා ජනතාවට සපයන සුහසාධන පහසුකම් ඉහල නැංවීම පිළිබඳ යෝජනා කිසිවක් එම සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | බල ප්‍රදේශයේ සංවර්ධන හා සුහසාධන පහසුකම් සැපයීමට අදාල යෝජනා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතුවේ. | සිදුව ඇති දුර්වලතා මඟහරවා ඉදිරි සැලසුම් පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | ප්‍රතිපාදන සලසා ගෙන අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුවේ. | සභාවේ පවතින මුදල් තත්ත්වය මත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් වෙනත් මූලාශ්‍රයක් මගින් ප්‍රතිපාදන සලසා ගෙන ප්‍රාථමික මට්ටමින් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරන බවත් දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂයේදී තිරසර සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇති බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘති 05 ක වසර 02 කට වඩා වැඩි කාලයක සිට ජල මනු අක්‍රීය වී ඇති පාරිභෝගිකයින් 166 ක ගෙන් ස්ථාවර ගාස්තු පමණක් අයකරමින් පැවති අතර අක්‍රියව පවතින ජල මනු අළුත්වැඩියා කිරීමට හෝ නව මනු සවි කිරීමට කටයුතු කර නොතිබුණි. | ජල මනු සවිකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ජල සම්පාදන මණ්ඩලය මගින් ජල මීටර් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේදී හා 2019 වර්ෂයේදී සිදුව තිබූ වාහන අනතුරු තුනකට අදාලව රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය නොකරන ලද එකතුව රු. 43,217 ක අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රියදුරන්ගෙන් අයකළ යුතු මුදලක් වේ නම් අයකර ගැනිමටත්, ගිණුම් පියවීමටත් කටයුතු කරන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 06 කට වඩා වැඩි කාලයක සිට පැවත එන සේවකයින් සිව් දෙනෙකුට අදාල රු. 82,450 ක් වූ ණය ශේෂ නිරවුල් කර ගෙන නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විටින්විට දැනුවත් කිරිම් සිදු කළද අයකර ගැනීමට නොහැකි වූ බවත් තවදුරටත් කටයුතු කරන බවත් දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 03 ක් ඉවත්කිරීමට හෝ නියමානුකූල කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කළ යුතුවේ. | සෑම නව ඉදිකිරීමක්ම සභාවේ අනුමැතිය සහිතව ඉදිකළ යුතු බවට ශබ්ද විකාශන යන්ත්‍ර මගින් මහජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කර ඇති බවත් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 62,978,721 ක් වූ ජංගම නොවන වත්කම් සභාව සතුව පැවතියද ඊට අදාල වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන අතර, අඩුපාඩු සොයා බලා කටයුතු කරන බව දන්වමි. |

**3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවනයෙන් ඉවත් කල වාහන 05 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාල වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහන 02 ක් වෙන්දේසි කිරීම පිණිස තත්ත්ව වාර්තාවක් ලබාගෙන ඇති බවත්, ඉතිරි වාහන සභා තීරණයක් මත වෙන්දේසි කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු කරන බවත් දන්වමි. |

**3.5.3 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව පරිහරණය කරන වාහන 04 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව පරිහරණය කරන වාහන පවරා ගත යුතුවේ. | සොයා බලා කටයුතු කරන බව දන්වමි. |

**3.5.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අපද්‍රව්‍ය බැහැර කිරිමට විධිමත් වැඩපිළිවෙලක් සභාව සතුව නොමැති වීම හේතුවෙන් 2014 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබූ ගලි බවුසරය සභා පරිශ්‍රය තුල නිෂ්කාර්යයව පැවතුණි. | ගලි බවුසරය භාවිතයට ගැනීමට හෝ අවශ්‍යතාවය සහිත පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීමට හෝ කටයුතු කළ යුතුවේ. | යෝජිත මලපවහන පද්ධතිය ක්‍රියාත්මක වීමත් සමඟ ගලි බවුසරය ප්‍රයෝජනයට ගතහැකි වනු ඇති බව දන්වමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1(ආ) මාර්ගෝපදේශයේ විධිවිධාන වලට පටහැනිව අවම වශයෙන් ආයතන 03 කින් මිල ගණන් කැඳවීමෙන් තොරව රු. 193,158 ක් වැයකර වානේ කබඩ් 05 ක් හා වායු සමීකරණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. | භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නියෝජිත ආයතනයක් ලෙස කටයුතු කරන දම්රෝ ආයතනය විසින් අලෙවි ආයතනවල මිල ගණන් කැඳවා ලබා දීමෙන් පසු ඒ අතරින් අඩුම මිල ගණන් ඉදිරිපත් ව තිබූ ආයතනයෙන් වානේ කබඩ් මිලදී ගත් බව දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2009 මාර්තු 09 දිනැති හා අංක 2009/01 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වුවත්, කඩකාමර 14 ක බදු කුලිය එලෙස සංශෝධනය කර නොතිබුණි. | වසර 05 කට වරක් බදු දේපල තක්සේරු කර බදු කුළිය සංශෝධනය කළ යුතුවේ. | ඕපනායක කඩකාමර වල තක්සේරුව සිදුකර ඇති බවත්, ඉතිරි කඩකාමර තක්සේරු කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ වටිනාකම රු. 43,250 ක් වූ භාණ්ඩ ඒකක 36 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ ඌණතා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | එවකට සිටි නිලධාරීන් විමසා කටයුතු කරන බව දන්වමි. |